ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023

අවසාන පරීක්ෂණය - 2023

**SNP8335** - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.16 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "සමාජ ස්ථරායනය" ලෙස ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වඩාත් සුදුසු මාපිය විලාසය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පාසල් විරෝධී සංස්කෘතියේ ලක්ෂණ හතරක් (04) ලියන්න.

04. සමාජ විද්‍යාඥයින් විසින් හඳුනාගෙන ඇති මූලික සමාජ ස්ථරායන පද්ධති හතර (04) නම් කරන්න.

05. විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පාසලේ සමවයස් මිතුරන් සමඟ අන්තර් සබඳතා ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාමේ දී මුහුණ දෙන අභියෝග පහක් (05) පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ පාසල් පසුබිම තුළ විධිමත් අධ්‍යාපනය ලැබීමේ දී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මුහුණ දෙන ගැටලු තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

07. වර්තමානයේ විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ජනමාධ්‍ය වෙත ප්‍රවේශය ලබා ගැනීමට ඇති පහසුකම් පහක් (05) ලියන්න.

08. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සමෝධානය කිරීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) 'සමාජානුයෝජනය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) සමාජානුයෝජනයේ ද්විතියික කාරකයන් තුනක් (03) නම් කර ඉන් එකක් (01) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) "විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සමාජානුයෝජනය කිරීම විශාල අභියෝගයක් බවට පත් වේ." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ ද? සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමාජානුයෝජනය කිරීමේ දී දෙමාපියන්ගේ ප්‍රධාන කාර්ය භාර තුනක් **(03)** සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) තම විශේෂ අවශ්‍යතා සහිත දරුවා සමාජානුයෝජනය කිරීමේ දී නිවස තුළ දී දෙමාපියන් මුහුණ දෙන ගැටලු තුනක් **(03)** ලියන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් ගැටලු අවම කර ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11. (i) 'සමවයස් මිතුරන්' ලෙස ඔබ අදහස් කළේ කුමක් ද? (ලකුණු 02)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සංවර්ධනය උපරිම කිරීම සඳහා සම වයසේ මිතුරන්ගේ හැකියාවන් උපයෝගී කර ගැනීමට යොදා ගත හැකි උපාය මාර්ග හතරක් **(04)** ලියන්න. (ලකුණු 08)

(iii) විශේෂ අවශ්‍යතා සහිත සිසුන් පාසල් පසුබිම තුළ සම වයසේ මිතුරන් සමඟ අන්තර් ක්‍රියා කිරීමේ දී මුහුණ දෙන ගැටලු හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) විශේෂ අවශ්‍යතා සහිත දරුවා පාසලේ දී සමාජානුයෝජනය කිරීමේ දී ගුරුවරුන්ගේ දායකත්වයේ වැදගත්කම පිළිබඳ ව ලියන්න. (ලකුණු 06)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමාජානුයෝජනය කිරීමේ දී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් අභියෝග ජය ගැනීම සඳහා භාවිත කළ හැකි යෝජනා හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. (i) සමාජ සචලනය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ධනාත්මක සමාජ සචලනය සාක්ෂාත් කර ගැනීමේ දී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් ගැටලු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ධනාත්මක සමාජ සචලනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපනය සතු භූමිකා තුනක් **(03)** පරීක්ෂා කරන්න. (ලකුණු 12)

14. (i) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කෙරෙහි ජනමාධ්‍යවල ධනාත්මක බලපෑම් හතරක් **(04)** ලියන්න. (ලකුණු 04)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමාජානුයෝජනය කිරීම සඳහා ජනමාධ්‍ය භාවිත කළ හැකි බවට කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා ජනමාධ්‍ය භාවිත කිරීමේ දී විශේෂ අවශ්‍යතා සහිත සිසුන් මුහුණ දෙන ගැටලු තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.